# බෝම්බ පිපරවීම ත්‍රස්තවාදය පැරදවීම හා ජනතාව රැකීම

රනිල් වික්‍රමසිංහ මහතාට අනුව ආණ්ඩුවේ කොටි ත්‍රස්තවාදය පැරදවීමේ ක්‍රියාවලිය අසාර්ථක වී ඇත. ඔහු සහ ඔහු මෙන් සිතන්නවුන් කියන්නේ කොළඹ හා අනෙකුත් පෙදෙස්වල බෝම්බ පිපිරීමෙන් පෙන්නුම්කරන්නේ ආණ්ඩුවේ අසාර්ථකභාවය බවය. එහෙත් ඇතැම් රූපවාහිනී නාලිකා හා ගුවන්විදුලි නාලිකා හැරෙන්නට අනෙක් ජනමාධ්‍යවලට අනුව කොටි ක්‍රමයෙන් කිලිනොච්චිය වටා ප්‍රදේශයකට කොටුවෙමින් සිටිති. රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශය අඩුම තරමින් බටහිරයන්ගේ අවධානයටවත් යොමු වේ යැයි සිතිය නො හැකි ය. ඔවුහු ද එය සත්‍ය ප්‍රකාශයක් නොවන බව දනිති. එහෙත් හැකිනම් ඔවුන් එය තම වාසියට යොදාගනු ඇත.වික්‍රමසිංහ මහතා මෙවැනි ප්‍රකාශ විශේෂයෙන් ම බටහිරයන් පවා හිනස්සන පචාර කරන්නේ කාගේ වවමනාවට ද? ඔහුට එමගින් එ ජා පක්‍ෂයේ නායකත්වය පවා තහවුරු කරගත නො හැකි ය. එහෙත් මෙරට ඉතිහාසය නොදන්නා  එස්. බී. දිසානායක මහතා හෝ වෙනත් අයකු හෝ පක්‍ෂ නායකයාවීමෙන් රටටවත් පක්‍ෂයටවත් යහපතක් නොවනු ඇත. රටේ ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවට ත්‍රස්තතවාදය පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරක් දිය නොහැකි බව වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන්නේ එමගින් ආණ්ඩුව පැරදවිය හැකි යැයි සිතාගෙන ද? විකුමසිංහ මහතාට උපදෙස් දෙන මෙරට හෝ පිටරට හෝ බලවතකු උපදෙස් යැයි කියමින් ලණු දෙන ප්‍රවනතාවක් ඉන් පිළිබිබු වන්නේ ද?

එ ජා පක්‍ෂයේ කෙතරම් බටහිර ගැත්තන් සිටිය ද,  අද මෙන් බටහිරට දණ්ඩ නමස්කාර කරන නායකයකු කලින් බිහි වී නො මැත. ජේ. ආර්. ජයවර්ධන මහතා වුව ද මෙතරම් බටහිර ගැති ප්‍රතිපත්තියක් අනුගමනය නො කෙළේ ය. අනෙක් අතට තම රටේ ආණ්ඩුවට  විරුද්ධව විදේශවල ඇවිදිමින් මෙලෙස ප්‍රචාරයක් ගෙනයැම ද ඉතාමත් අවම මට්ටමකින් සැසඳිය  හැක්කේ තම සැමියාට එරෙහිව ගම වටා ගොස් අඳෝනා නගන ගැහැණියකට ය. රනිල් වික්‍රමසිංහ මහතා එවැනි ගැහැණියක මෙන් අඳෝනා නැගීමෙන් පමණක් සෑහීමකට පත් නොවෙයි. ඔහුට අවශ්‍ය වන්නේ කෙසේ හෝ ආණ්ඩුව එළවා දමා තමා බලයට පත්වීමට ය.

අද අප රට මුහුණ දෙන්නේ ලෝකයේ මෙතෙක් බිහි වී ඇති දරුණුම ත්‍රස්තවාදී සංවිධානයට යැයි කිව හැකි ය. හිත් පිත් නැති දරුණුම ගණයේ ෆැසිස්ට්වාදියකු වූ ප්‍රභාකරන් තම අරමුණ වූ වෙනම රාජ්‍යයක් ලබාගැනීම සඳහා අසරණ සිවිල් වැසියන් දහස් ගණනින් මරාදමා ඇත. ඔහු තව තවත් මිනිසුන් මැරීමට බලාපොරොත්තු වෙයි. බසයක දුම්රියක ගමන්කරන මගියකු පමණක් නොව පයින් යන්නකු ද, තමන්ගේ ම වූ පෞද්ගලික රියක යන්නකු ද කොටි බෝම්බ ප්‍රහාරයකට හසුවිය හැකි ය. ආණ්ඩුවට මේ සියළු දෙනාට ම ආරක්‍ෂාව ලබාදිය නොහැකි බව පැහැදිළි ය. රනිල් වික්‍රමසිංහ මහතාගේ මාමා වූ ජේ. ආර්. ජයවර්ධන මහතා පවා එකල කීවේ තම තමන් ආරක්‍ෂාව සපයාගත යුතු බව ය.

ආන්ඩුවට සියළු ජනතාවට තබා චන්ද්‍රකාන්තන් (පිල්ලියාන්) මහතාගේ පක්‍ෂයේ සාමාජිකයන් සියළු දෙනාට වුවත් ආරක්‍ෂාව සැපයිය හැකි නො වෙයි. ඒ මහතාගේ පක්‍ෂයේ අය ආයුධ තබාගැනීමට විරුද්ධව ආණ්ඩුව පියවර නොගන්නේ එබැවින් විය යුතු ය. කොටි ඒ පක්‍ෂයේ අය මරා දමන්නේ තෝරා බේරාගෙන තුවක්කු රයිෆල් වැනි ආයුධවලින් බැවින් ඔවුන්ට තම තමන් ළග ආයුධ තබාගැනීමෙන් යම් ආරක්‍ෂාවක් සැපයෙයි. එහෙත් ක්ලේමෝ බෝම්බවලින් හෝ වෙනත් එවැනි බෝම්බවලින් හෝ මිය යන අහිංසක සාමාන්‍ය ජනයාගේ ජීවිත ඔවුන්ට ආයුධ ලබාදීමෙන් බේරාගත හැකි නො වෙයි. ආණ්ඩුවට විරුද්ධව විදේශ රටවල ගතු කියමින් ඇවිදීමට මෙරට මුදල් හා තම විරුද්ධ පක්‍ෂ නායක පදවිය යොදාගන්නා රනිල් වික්‍රමසිංහ මහතා කොටි අහිංසක ජනයා මරා දැමීම ගැන ඒ රරවල දී වචනයක් කතා නොකරයි. ඔහු රටට ආදරයක් ඇති නායකයකු නම් කළ යුතුව ඇත්තේ කොටින්ට විරුද්ධව විදේශවල යම්කිසි ආකාරයක ප්‍රචාරයක් ගෙන යැම ය. එහෙත් ඔහු නොකරන්නේ  ද එයම ය. රනිල් වික්‍රමසිංහ මහතා පමණක් නොව රාජ්‍ය නොවන හා වෙනත් බොරු ප්‍රබුද්ධ ඇංකරයෝ ද කොටි විසින් ජනතාව මරණු ලැබීමට විරුද්ධව කොටුව දුම්රිය පොළ අසළ හෝ ලිප්ටන් වටරවුමේ හෝ උද්ඝෝෂණ නොකරති. වැඩිම වුවහොත් ඔවුන්ගෙන් ඇතමකු ඒ පිළිබඳ ව ඇල් මැරුණු ප්‍රකාශයක් නිවේදනය කරති.

කොටි බෝම්බවලින් සිදුවන හානිය යොදාගනිමින් ආණ්ඩුව පෙරළා දැමීමට කටයුතුකරන  වික්‍රමසිංහ මහතාට සහාය වීම සඳහා ද කොටි බෝම්බ පුපුරවන්නේ යැයි යමකු කිවහොත් ඒ අතාර්කික කියමනක් නො වෙයි. අපේ වීරෝදාර

© Prof. Nalin De Silva

හමුදාව මගින් කොටි පැරදවීම අද කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි. කෙදිනකවත් පැරදිය නොහැකි යැයි ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවල කසිකබල් උගතුන් අපට පැවසූ කොටි සංවිධානයට අද ජීවිත බේරාගැනීම සඳහා දිවීමට සිදු වී ඇත. වන්නි කැලයේ ප්‍රභාකරන් සිටින්නේ නම් ඔහුගේ ආයු කාලය ද එතරම් දීර්ඝ නොවන බව පැහැදිලි ය.

කොටි ත්‍රස්තවාදීන්ට අද කළ හැක්කේ බෝම්බ පුපුරවා අහිංසක මිනිසුන් මරාදැමීම පමණ ය. ඇතැම්විට හමුදාව අතින් කොටි සංවිධානය මුළුමනින් ම පරාජය කරනු ලැබීමෙන් පසුව ද ටික කලක් යනතුරු කොටි බෝම්බ පුපුරවනු ඇත. එසේ වුවත් අද කළ යුත්තේ කුමක් ද? බෝම්බ පිපිරවීම මුළුමනින් ම නවතා දැමිය හැක්කේ කෙසේ ද? රනිල් වික්‍රමසිංහ මහතා ඒ ප්‍රශ්නවලට දෙන පිළිතුරු කවරේ ද? එහි දී ඔහු මූලික වශයෙන් ම කියනු ඇත්තේ ආණ්ඩුව පරාජය කළ යුතු ය යන්න ය. ඔහුගේ හා ඔහු හා සමව සිතන්නන්ගේ තර්කය මහජනයාට ආරක්ෂාව දිය නොහැකි ආණ්ඩුවක් පළවා හැරිය යුතු ය යන්න ය. මහජනයාට ආරක්ෂාව දීම ආණ්ඩුවේ වගකීමක් බව සැබෑ ය. අද මහජනතාවට ආරක්ෂාවක් නැතිවීමට හේතුව කුමක් ද? ඒ ආණ්ඩුවේ දුර්වල කම ද? මහජනතාවට අද ආරක්ෂාවක් නැත්නම් එයට හේතුව ත්‍රස්තවාදය ය. රනිල් වික්‍රමසිංහ මහතා එසේ නොසිතුව ද, ඵලය නැතිකළ හැක්කේ හේතුව නැතිකිරීමෙන් ය. වික්‍රමසිංහ මහතා කෙසේ වෙතත් සංස්කෘතියෙන් සිංහල බෞද්ධ වූ අය ඒ බව දනිති. වික්‍රමසිංහ මහතා සිංහල බෞද්ධ සංස්කෘතිය නොදන්නා බව ඔහුගේ හැසිරීමෙන් සනාථ වෙයි. ඔහු ද එ ජා ප පක්ෂයක් ලෙස ද කටයුතු කරන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය.

ත්‍රස්තවාදය පරාජයකිරීමට මේ ආණ්ඩුව ක්‍රියාකරයි. ආණ්ඩුවේ දූෂණ, නාස්තිය ආදිය අහස උසට ඇත. ඒ සියල්ල එසේ තිබිය දී අද රටට වැදගත්වන්නේ තස්තවාදය මුළුනුපුටා දැමීම බැවින් ආණ්ඩුව ඒ සඳහා දරණ උත්සාහයට රනිල් වික්‍රමසිංහ මහතා වුව ද සහාය දිය යුතු ය. එහෙත් ඔහු එසේ නොකරනවා පමණක් නොව එයට අකුල් හෙළන ආකාරයෙන් වැඩකරයි. අනෙක් අතට දූෂණය, නාස්තිය, ජීවන වියදම වැඩිවීම, ප්‍රජාතන්ත්‍රවාදය පිරිහීම ආදිය පිළිබඳ ව රනිල් වික්‍රමසිංහ මහතා හා එ ජා ප කරන ප්‍රකාශවල කිසිම විශ්වාසනීයත්වයක් නැත. එයට හේතුව ඒ එකකටවත් එ ජා පක්ෂයට විසඳුමක් නැති වීම ය. එ ජා පක්ෂය බලයේ සිටිය දී දූෂණය, නාස්තිය නැතිවූවා නොවේ. එමෙන් ම එකල ජීවන වියදම අඩුවූ බවක් ද ජනතාවට මතක නැත. ප්‍රජාතන්ත්‍රවාදය එකල ආරක්ෂා වූ අන්දම මා පාර්ශ්වයේ මංගල සමරවීර මහතාගෙන් අසා දැනගත හැකි ය. එවිට පක්ෂ දෙක තරාදියේ දා බැලූ විට පෙනෙන්නේ ආණ්ඩු පක්ෂය අඩුම තරමින් ත්‍රස්තවාදය පරාජයකිරීමේ දී වැදගත් කාර්යයක නිරත වී ඇති බව ය. රනිල් වික්‍රමසිංහ මහතා ත්‍රස්තවාදයට උඩගෙඩි දෙමින් ඊනියා සටන් විරාම ගිවිසුමක් අත්සන් කෙළේ ය. රට බෙදීමට තල්ලුවක් ලැබෙන ආකාරයෙන් උතුරු හා නැගෙනහිර පළාත් එකතුකර එක් පළාත් සභාවක් පිහිටු වූයේ ජේ ආර් ජයවර්ධන මහතා ය. එවැනි පසුබිමක රනිල් වික්‍රමසිංහ මහතා හා එ ජා ප කරන කතාවලට වැදගත්කමක් නො ලැබෙයි.

දැන් පඬියකු පවසනු ඇත්තේ ත්‍රස්තවාදයට හේතුව දෙමළ ජනයාගේ ප්‍රශ්න නොවිසඳීම බව ය. මේ ප්‍රශ්නය අපි දිගින් දිගට සාකච්ඡා කර ඇත්තෙමු. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම පමණක් සිදු වී ඇති ප්‍රශ්නයක් නැත. මේ සියල්ල පටන්ගත්තේ සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව කිරීමෙන් පසුව යැයි කසිකබල් මාක්ස්වාදීන් ද ඇතුළු ඇතැම් පඬියන් කියන කතාව පට්ටපල් බොරුවක් වන්නේ චෙල්වනායගම් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවා ගත්තේ එයට බොහෝ කලකට පෙර බැවිනි. මේ ප්‍රශ්නයේ මුල ඇත්තේ බ්‍රිතාන්‍යයන් විසින් දහනවවැනි සියවසේ සිට පෝෂණය කරනු ලැබූ දෙමළ ජාතිවාදය ය. ත්‍රස්තවාදය ඇති වූයේ දෙමළ ජාතිවාදයේ විකාශයෙහි ප්‍රතිඵලයක් ලෙස ය. ත්‍රස්තවාදය සමග දේශපාලන හා මතවාදී වශයෙන් දෙමළ ජාතිවාදය ද පරාජය කළ යුතුවෙයි. එපමණක් නොවේ. අද ත්‍රස්තවාදය පරාජයකිරීමට එරෙහිව ගතුකියන, හමුදා මෙහෙයුම් සැහැල්ලුවට ලක්කරන, හමුදා භටයන්ගේ ධෛර්යය හීන කරන රනිල් වික්‍රමසිංහ මහතා ද එ ජා පක්ෂය ද දේශපාලන වශයෙන් පරාජය කළ යුතු වෙයි. ජනතාව ආරක්ෂාකළ හැක්කේ ත්‍රස්තවාදය හා සම්බන්ධ සියළු ප්‍රපංච පරාජය කිරීමෙනි. වෙනත් වචනවලින් කියන්නේ නම් ජනතාව ආරක්ෂාකිරීමට මෙතෙක් කල් කළ අයුරින් දිගට ම වික්‍රමසිංහ මහතා පරාජය කළ යුතු ය. එපමණක් නො වෙයි. කවරකුගේ නායකත්වයෙන් වුව ද වර්තමානයෙහි එ ජා ප ප්‍රතිපත්ති සිංහල විරෝධී වෙයි. වෙනත් වචනවලින් කියන්නේ නම් ජනතාවගේ ආරක්ෂාව සඳහා වික්‍රමසිංහ මහතා ඇතිව හෝ නැතිව හෝ එ ජා ප පැරදවිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva